**යාපනය විශ්ව විද්‍යාලය - 2016**

**--------------------------------**

යාපනය විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2017 ජූලි 14 දින විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූලවීම**

**ශ්‍රීලංරාගිප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ**

පෙර වර්ෂවලදී රු. 1,123,900,383 ක පිරිවැයකට විශ්වවිද්‍යාලය විසින් ප්‍රසම්පාදනය කරන ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රමිතියේ 65 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒවායේ අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කර ගිණුම්ගත කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

රු. 333,885 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙනැවිත් තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂවල විගණන වාර්තාවල පෙන්වා දී ඇති අතර 2014 අගෝස්තු 22 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද සාකච්ඡා කරන ලදී. ඒ අනුව පාලක සභාවේ අනුමැතිය සහිතව ඉදිරියේදී මෙම කරුණ නිරවුල් කර ගැනීමට උපකුලපතිවරයා එකඟ වී තිබුණි. කෙසේවුවද, අදාළ බලධාරීන් විසින් 2017 අගෝස්තු 15 වන විටත් කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු. 330,301,496 ක් වටිනා පුස්තකාල පොත් පිළිබඳ සත්‍යාපන වාර්තා වර්ෂ 30 කට වැඩි කාලයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 7 කට වැඩි කාලයක් හිඟව පැවතුණු රු. 1,318,007 ක් වූ ආපදා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂවලදී විවිධ පාර්ශවයන්ට ගෙවන ලද එකතුව රු. 9,947,589 ක් වූ පහත සඳහන් අත්තිකාරම් ඔවුන් විසින් 2017 ජූලි 31 වන විටත් විශ්වවිද්‍යාලයට නිරවුල් කර නොතිබුණි.

| පාර්ශවයේ නම | මුදල | හිඟව පැවති කාලය |
|---|---|---|
| | රු. | වර්ෂ |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 979,575 | 5 |
| නල්ලූර් ප්‍රාදේශීය සභාව | 204,104 | 3 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 101,000 | 3 |
| ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය | 10,000 | 4 |
| සහකාර ලේඛකාධිකාරී, කෘෂිකර්ම | 46,050 | 1 |
| මූල්‍යාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 1,713,600 | 1 |
| පොත් හා වාර සඟරා සැපයුම්කරු | 6,893,260 | 6 |
| | **9,947,589** | |

## 2.4 නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරික්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 272(1) | සියලු ගෙවීම් වවුචර් අදාළ වන මාසය අවසානයේ සිට සති 6 ක් ගතවීමට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද කිසිදු ගෙවීම් වවුචරයක් මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 756 | 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වාර්තා කරන ලද භාණ්ඩ විෂයයන් 120 ක හා 274 ක පිළිවෙලින් වූ ඌනතාවයන් හා අතිරික්තයන් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) චක්‍රලේඛ විධිවිධාන** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට අයත් වාහන 17 කට අදාළව මෙම ක්‍රියාපරිපාටිය සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 197,158,693 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 141,526,367 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 55,632,326 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පුද්ගලික පඩිනඩි, නඩත්තු වියදම්, ගිවිසුම්ගත සේවා සහ වෙනත් මෙහෙයුම් වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 197,158,693 ක ඌනතාවයක් වුවද, පුද්ගලික පඩිනඩි, රජයට ගෙවන ලද බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අගය එකතු කිරීම රු. 1,846,352,464 ක් විය. තවද පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා අගය එකතු කිරීම රු. 342,592,161 කින් හෙවත් සියයට 23 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි විය.

**(අ) විභාග ප්‍රතිඵල**

----------------

1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, විභාගය පවත්වා මාස තුනක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන් යටතේ පවත්වන ලද විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2015 හා 2016 වර්ෂයන් තුළ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු, කෘෂිකර්ම, කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ, විද්‍යා යන පීඨයන්හි හා බාහිර විභාග ඒකකයෙහි විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී මාස 04 සිට මාස 12 දක්වා සැලකිය යුතු කාල පරිච්ඡේද ප්‍රමාදයන් තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. ඒ අනුව නියමිත කාලය තුළදී ශිෂ්‍යයින්ට රැකියා ලබාගැනීමේ අවස්ථාවන් අහිමි කර තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂ විගණන වාර්තාවලින්ද පෙන්වාදී තිබුණද, විභාග පවත්වා මාස 3 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අදාළ අධිකාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 4.2 මෙහෙයුම් දුර්වලතා

-------------------------

#### 4.2.1 පුස්තකාල පරිපාලනය

-------------------------

නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත වාර සඟරා, සැපයීමේ දුර්වල පාලනය හේතුවෙන්, පෙර වර්ෂවලදී ඇණවුම් කරන ලද රු. 66,769 ක් හා ඩොලර් 5,340 ක් වටිනා වාර සඟරා 2016 දෙසැම්බර් 31 වන විටත් ලැබී නොතිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව මත යන ලද විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් 74 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු රාජකාරී සඳහා වාර්තා කර හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී හෝ නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ඔවුන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු. 71,000,000 ක බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 3,150,000 ක පිරිවැයකට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් 2013 දෙසැම්බර් 01 දින පුද්ගලික පාර්ශවයකට පිරිනමා තිබූ අතර එම කාර්යය වැඩ කරන දින 90 ක කාල පරිච්ඡේදයක් තුළ නිම කළ යුතුවිය. පිරිවැය හා විෂය පථයේ විචලනයන් හේතුවෙන් නිශ්චිත කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළ කාර්යය නිම කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට විධිමත් උපදෙස් දීම මඟින් මෙම කොන්ත්‍රාත්තුව මෙහෙයවීමට විශ්වවිද්‍යාල පරිපාලනය අසමත් වී තිබුණි. තවද විධිමත් ඇගයීමක් නොමැතිව අවස්ථා 10 කදී කාලය දීර්ඝ කර තිබූ අතර මෙම කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රමාණ කළ අලාභ අය කර නොතිබුණි.

(ඇ) නව ඇණවුම් ඉදිරිපත් කිරීමට පෙර තිබෙන තොග පිළිබඳව හා අවශ්‍යතාවය පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් සලකා බලා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 207,014 කට ප්‍රසම්පාදනය කරන ලද විෂයයන් නිශ්කාර්යව තැබීමට ඉඩ හැර තිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව ත්‍යාග ගෙවීම් සම්බන්ධයෙන් තොරතුරු සිසුන්ට සැපයීමට විශ්වවිද්‍යාලය අසමත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂයේදී රු. 83,200 ක් වටිනා ශිෂ්‍යත්ව ත්‍යාග සඳහා චෙක්පත් සිසුන් 111 දෙනෙකුට නිකුත් කර නොතිබුණි.

(ඉ) ගෙවීම් පිළිබඳ උපරිම සීමාව හා පෙර අත්තිකාරම් නිරවුල් කිරීමේ කාලය ආදිය විධිමත්ව තක්සේරු කිරීමකින් තොරව විවිධ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවා තිබූ අතර අත්තිකාරම් පාලනය පිළිබඳ දුර්වලතා හේතුවෙන් එම අත්තිකාරම් නිරවුල් කිරීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) 2004 වර්ෂයේදී ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවන ලද රු. 163,653 ක මුදලක් 2017 අගෝස්තු 30 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය වෙත නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පාලක සභාවේ අනුමැතිය සහිතව මෙම අත්තිකාරම අත්හැර දැමීමට කටයුතු කරන බව විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් දන්වා තිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

------------------------

නීති දෙපාර්තමේන්තුවේ රු. 213,000 ක් වටිනා භාණ්ඩ විෂයයන් නැතිවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මූලික පරීක්ෂණ සිදු කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.5 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නිරවුල් නොවූ කරුණු

---------------------------------------------------------------------

(අ) සියලුම කාර්ය මණ්ඩලය තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍රයට ඇතුළත් කළ යුතුය. කෙසේ වුවද, කාර්ය මණ්ඩලයේ වැඩි දෙනෙක් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සටහන් සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2014 අගෝස්තු 22 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට අනුයුක්ත සියලුම නිලධාරීන් විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී විසින් පනවන ලද රීති හා රෙගුලාසි සහ නියෝග අනුගමනය කළ යුතු බවට නියෝග කරන ලදී.

කෙසේ වුවද, මෙම වාර්තාවේ දිනය දක්වා විශ්වවිද්‍යාලය විසින් එම නියෝග අනුගමනය කර නොතිබුණි. මෙම කරුණ 2012 වර්ෂයේ සිට විගණන වාර්තාවල වාර්තා කරන ලදී.

(ආ) රු. 104,220 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් 2012 වර්ෂය තුළදී නැති වී තිබුණි. එම පාඩුව පිළිබඳ වගකීම විශ්වවිද්‍යාලය විසින් නිශ්චය කර තිබූ අතර පාලක සභාවේ තීරණය පරිදි, අදාළ නිලධාරියාගෙන් සම්පූර්ණ ආදේශක පිරිවැය වන රු. 115,800 ක් අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද එම පාඩුව අදාළ නිලධාරියාගෙන් 2017 ජූලි 31, විගණන දිනය වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඇ) සංගීත දෙපාර්තමේන්තුවේ "ඩිජිටල් ලර්නින් ආර්කයිව්ස්" හි තබා තිබුණු රු. 140,000 ක් වටිනා පුද්ගලික පරිගණක 2 ක් 2014 අප්‍රේල් 28 දින සොරකම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදු කිරීම සඳහා උපකුලපති විසින් නිලධාරීන් 2 දෙනෙකු නම්කර තිබුණි. කෙසේ වුවද, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මූලික පරීක්ෂණ පැවැත්වීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රදාන ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම පීඨයට නිකුත් කරන ලද පීඨාධිපතිගේ කාර්යාලයට අයත් රු. 98,700 ක් පිරිවැය වූ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය 2015 පෙබරවාරි 13 දින දෙවන වසර දේශන ශාලාවෙන් අස්ථානගතව තිබුණි. මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව මෙම පාඩුව පිළිබඳව මාසයක් ඇතුළත වාර්තා කිරීම සඳහා කෘෂිකර්ම පීඨයේ පීඨාධිපතිට නොහැකි වී තිබුණි. පාලක සභාව විසින් මූලික පරීක්ෂණ සඳහා විමර්ශන නිලධාරින් පත්කර තිබුණද, පාඩුව අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2017 ජූලි 31 දක්වා කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් 2015 අගෝස්තු 07 දින විද්‍යා පීඨයේදී සොරකම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2017 ජූලි 31, විගණන දිනය දක්වා කිසිදු පියවරක් විශ්ව විද්‍යාලය විසින් ගෙන නොතිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති අනධ්‍යයන සේවක තනතුරු පුරප්පාඩු 180 ක් පිරවීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පීඨ 7 ක මහාචාර්ය, සහාය මහාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යනාදි ප්‍රධාන අධ්‍යයන තනතුරුවල පුරප්පාඩු 142 ක් පැවතුණි. කෙසේ වුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. එසේම වවුනියා මණ්ඩපයේ පැවති අධ්‍යයන හා අනධ්‍යයන තනතුරු පුරප්පාඩු 73 ක් පිරවීම සඳහා කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා වර්ෂ 5 කට වැඩි කාලයක් පුහුණුවන කළමනාකරණ සහකාරවරුන් 30 දෙනෙකු යොදවා තිබුණි.

## 4.7 වත්කම් කළමනාකරණය

----------------------------

### 4.7.1 නිෂ්කාර්ය වත්කම්

---------------------

පහත නිරීක්ෂණයන් කරන ලදී.

(අ) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ "සී" ගොඩනැගිලි සංකීර්ණයේ දේශන ශාලාව ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් රු. 64,429,531 ක මුදලක් වැය කර තිබුණි. 2015 මැයි 31 දින ඉදිකිරීම් වැඩ නිම කර 2015 ජූලි 23 දින විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද, ගොඩනැගිල්ලේ කොටසක් අරමුණු කළ කාර්යය සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව තිබෙන්ට ඉඩ හැර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ගබඩා 1 හා 11 හි තබා ඇති රු. 234,975 ක් රු. 1,320,659 ක් හා රු. 325,409 ක් වටිනා පිළිවෙලින් නිෂ්කාර්ය, භාවිතා කළ නොහැකි හා සෙමින් චලනය වන විෂයයන් වර්ෂ 02 සිට වර්ෂ 18 ක් දක්වා කාල පරිච්ඡේදයක් පැවතුණු අතර මේ සම්බන්ධයෙන් ඒවා උපයෝජනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.8 ප්‍රසම්පාදන පරිපාටියට අනුකූලවීම

--------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ කාර්යාලීය ලී බඩු හා උපකරණ, ගොඩනැගිලි, පොත් හා වාර සඟරා, උපාධි ලෝගු, දුරකථන හුවමාරු පද්ධති හා ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා රු. 1,118,964,032 ක මුදලක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තියට අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1(ආ) මාර්ගෝපදේශය අනුව, අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කාර්යයන්, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන කාර්යයන් ලැයිස්තු ගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අංක 07 සිට අංක 13 දක්වා සඳහන් කරන ලද විෂයයන් සඳහා නිම කිරීමේ ඉලක්ක දිනයන් දක්වා නොතිබුණි.

(ඈ) රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය අනුව, කාල ක්‍රමානුගත ක්‍රමයකට හා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට නිම කිරීම දක්වා පියවරයන් විස්තර කරමින් ප්‍රසම්පාදන කාල උපලේඛනයක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද කාල උපලේඛනය හා එක් එක් ප්‍රසම්පාදන කාර්යයේ පියවරයන් විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

# 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 විගණන විමසුම් පිළිබඳ පසුවිපරම් ක්‍රියාමාර්ග

2016 වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන විමසුම් 4 කට පිළිතුරු සැපයීම සඳහා විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | නැති වූ විෂයයන් පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | පුස්තකාල පරිපාලනය | වර්ෂ 30 කට වැඩි කාලයක් පුස්තකාල පොත් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි. |
| (ඇ) | ගබඩා පරිපාලනය | ගබඩා විෂයයන් ක්‍රමවත්ව පවත්වා ගැනීමට කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | රු. 196,427,614 ක පිරිවැයකට නේවාසිකාගාර 1 සහ 11 ඉදිකර තිබූ අතර බොහෝ අඩුපාඩු සහිතව විශ්වවිද්‍යාලයට භාර දී තිබුණි. ඉදිකිරීම් වැඩ දින 100 සිට දින 400 දක්වා කාල පරිච්ඡේදයක් ප්‍රමාද වී තිබුණි. නිම කිරීමේ ප්‍රමාදය පිළිබඳව විධිමත් ඇගයීමක් කිරීමෙන් තොරව කාලය දීර්ඝ කිරීම් මේ සම්බන්ධයෙන් අනුමත කර තිබුණි. |
| (ඉ) | ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් | ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් පිළිබඳ කටයුතු කිරීම ප්‍රමාද වීම. |
| (ඊ) | මානව සම්පත් කළමනාකරණය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. |
| (උ) | අත්තිකාරම් පිළිබඳ පාලනය | අත්තිකාරම් පිළිබඳ විධිමත් අධීක්ෂණය හා පාලනය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර නොතිබුණි. |
| (ඌ) | වාහන සංචිත කළමනාකරණය | ගමනේ අරමුණ, ඉන්ධන ඇණවුම් අංකය, දිනය හා ඉන්ධන බිල්පත් අංක වාහන ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි. |